**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - 2020**

-----------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ජාතික සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ජාතික සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ සටහන් අංක 9 අනුව ප්‍රාග්ධන වියදම් සඳහා ලැබෙන ප්‍රදාන, හිමිකම් යටතේ දක්වා වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුලදී විලම්භිත ආදායම් ලෙස හඳුනාගන්නා බව සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු රු. 1,650,050 ක ප්‍රාග්ධන ප්‍රදාන, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් යටතේ හඳුනාගැනීම වෙනුවට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයට අදාල රු. 4,624,227 ක් වූ ක්ෂය ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් විලම්භිත ආදායම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සටහන් කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු. 2,974,177 ක් වැඩියෙන් හා ප්‍රාග්ධන ප්‍රදාන රු. 1,650,050 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වේ. 2021 වර්ෂයේ ගිණුම් වල නිවැරදිව පෙන්නුම් කරන ලෙස උපදෙස් දෙන ලදී. | නිවැරදිව ගිණුම් තැබීම සිදු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනය විසින් සිදුකල ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු දේපල පිරියත උපකරණවල පිරිවැය රු. 2,064,612 ක් අඩුවෙන් දක්වා තිබුණි. එසේම වර්ෂයට අදාල ක්ෂය රු. 202,801 ක් අඩුවෙන් ද සමුච්චිත ක්ෂය රු. 279,177 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟ වේ. 2021 වර්ෂයේදී පිරිවැය නිවැරදි කිරීමට විගණන අංශය සමඟද සාකච්ඡා කර තිරණයකට එළබෙන ලෙස උපදෙස් දෙන ලදී. | වර්ෂයට අදාල ක්ෂය නිවැරදිව ගණනය කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| (i) 371(2)(ආ) ඡේදය | තත්කාර්යය අතුරු අග්‍රිම සඳහා රු. 100,000 දක්වා පමණක් අත්තිකාරම් ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස එක් අවස්ථාවකදී රු. 112,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණි. | 2019 පත්වූ නව සභාපතිවරයා විසින් පැවැත්වූ පළමු පාලක මණ්ඩල රැස්වීමේ සාමාජිකයන් 19 දෙදෙනෙකු සඳහා රු. 6,000 ක් බැගින් පැමිණීමේ දීමනා ගෙවීම සඳහා ලබාගෙන ඇත. | චක්‍රලේඛය අනුව අත්තිකාරම් ගෙවීමේදී සීමාවන්ට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ii) 371(2)(ඇ) | තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවත් ඊට පටහැනි ලෙස මාස 04 සිට මාස 06 දක්වා වූ ප්‍රමාදයක් සහිතව අත්තිකාරම් පියවා තිබුණි. | ඉදිරියේදී අත්තිකාරම් අප්‍රමාදව පියවීමට කටයුතු කරන මෙන් උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛය අනුව නියමිත පරිදි අත්තිකාරම් පියවිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,743,322 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,852,255 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,891,067 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට, රජයේ ප්‍රදාන අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>-------------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------------------- | නිර්දේශය<br>---------------- |
|---|---|---|---|
| (අ) | 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ පනත අනුව ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තීන් සකස් කිරීම, කාලීනව සමාලෝචනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයාට සහ රජයට උපදෙස් දීම මූලික කාර්යය හා කර්තව්‍ය වුවත් මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | 2013 වර්ෂයේදී රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මගින් සකස් කර තිබුණු ප්‍රතිපත්ති සෞභාග්‍යයේ දැක්ම අනුව යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කොට එම ප්‍රතිපත්තිය සකස් කිරීමට අවශ්‍ය විද්වත් කමිටු පත්කිරීම සඳහා නාම යෝජනා ලබා ගෙන ඇත. තවද පවතින කොරෝනා වසංගත තත්වය මත කමිටු රැස්කීරීමේ ප්‍රමාදයක් පවතී. එම තත්වය බැහැර වූ පසු කමිටු රැස්කොට එම ප්‍රතිපත්තිය සකස් කිරීමට පියවර ගැනීමට උපදෙස් දී ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | පනතේ 16(2)ඊ වගන්තිය අනුව මානව සම්පත් සංවර්ධනයට අදාල විවිධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත බැංකුවක් පවත්වාගත යුතු වුවත් ආයතනය පිහිටුවා වසර 23 ක් ගත වී ඇතත් දත්ත බැංකුවක් සකස් කර නොතිබුණි. | මෙම දත්ත බැංකුවක් නිර්මාණය කිරීමට ප්‍රමානවත් නිපුණ දැනුමැති නිලධාරියෙකු අප ආයතනයේ නොමැති බැවින් ICTA ආයතනය සහ මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව සමග සාකච්ජා කළද නිසි ප්‍රතිචාරයක් ලැබී නොමැති අතර ආයතනයේ පවතින සේවක පුරප්පාඩු සඳහා ඉදිරියේදී බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව හා රටෙහි තත්වය සාමාන්‍ය අතට හැරුණු පසු ආයතනයේ කාර්යයන් ප්‍රමාදයකින් තොරව ඉටු කිරීමට හැකි වනු ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පනතේ 16(2)(1) හි එ සහ ඒ වගන්ති අනුව සභාවේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් විශේෂඥ කණ්ඩායම් බඳවාගැනිම සඳහා ආයතනයට බලතල ලබාදී තිබුණද 1997 සිට 2020 වර්ෂය දක්වා ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් ආයතනයේ කාර්යසාධනය හා බලතල ඉටු කිරීම සම්බන්ධයෙන් සෘජු බලපෑමක් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ දී එහි ආරම්භක පියවරක් ලෙස විශේෂඥ සංචිතය පිහිටුවීම සඳහා ඒ සඳහා කැමැත්ත ප්‍රකාශකරන අයගෙන් අයදුම්පත් කැඳවීම සිදුකර ඇත. තෝරාගෙන ඇති විශේෂඥයින්ගෙන් කැමැත්ත ප්‍රකාශකිරීමේ ලිපියක් මඟින් නැවතත් තොරතුරු ලබාගෙන සංචිතය පිහිටුවා වෙබ් අඩවියෙහි පල කිරීමට කටයුතු සැළසුම් කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |